www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආන්ඩුව පෙසප නායකයා දිගටම අත්අඩංගුවේ තබා ගනී

**කපිල ප්‍රනාන්දු විසිනි**
**2016 ජනවාරි 28**

දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) ප්‍රමුඛ ආන්ඩුව විසින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස අත්අඩංගුවට ගත්, පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ (පෙසප) දේශපාලන කමිටු සාමාජික කුමාර ගුනරත්නම්, මාස තුනකට ආසන්න කාලයක් රක්ෂිත බන්ධනාගාරයේ රඳවා ගෙන සිටී.

පසුගිය නොවැම්බර් 04 දා, ශ්‍රී ලංකාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් ගුනරත්නම් අත්අඩංගුවට ගනු ලැබුවේ, "සංචාරක වීසා බලපත්‍රයකින් ශ්‍රී ලංකාවට පැමින දේශපාලන කටයුතුවල නිරතවීම" යන චෝදනාව යටතේය.

අධිකරනයට ඉදිරිපත් කෙරෙන සෑම අවස්ථාවකම, අදාල චෝදනාව යටතේ අත්අඩංගුවට ගැනුන කෙනෙකුට ඇප ලබා දිය නොහැකිබව පවසමින්, ඔහු යලි යලිත් බන්ධනාගාර ගත කෙරෙයි. අවසන් වරට මේ මස 22 දා කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරනයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහු පෙබරවාරි 05 දා දක්වා බන්ධනාගාරගත කර ඇත.

ජනතා විමුක්ති පෙරමුනේ ප්‍රාදේශීය නායකයෙකුව සිටියදී 1988 වසරේ ගුනරත්නම් රටින් පලාගියේ, ජවිපෙ සාමාජිකයින් හා ගම්බද තරුනයින් 60,000 ක් ඝාතනය කෙරුනු, එක්සත් ජාතික පක්ෂ (එජාප) ආන්ඩුවේ ප්‍රචන්ඩත්වය හමුවේය.

ඕස්ට්‍රේලියාවේ රැකවරන පැතූ ඔහු පසුව එරට පුරවැසි භාවය ලබා ගත්තේය. ඉන්පසු ඔහු දිවයිනට පලමු වරට පැමිනියේ 2012 අප්‍රේල් මාසයේ දී ය. පෙසප නිල වශයෙන් දියත් කිරීමට පෙර දින, තවත් දේශපාලන කමිටු සාමාජිකයෙකු ද සමග ගුනරත්නම් පැහැර ගැනුනු අතර පසුව පොලිස් අත්අඩංගුවට පත් කෙරින.

ඔහු පසුගිය වසරේ ජනවාරියේ ලංකාවට පැමිනියේ මාසයක සංචාරක වීසා බල පත්‍රයක් මත බවත්, සිය වීසා බලපත්‍රය අවසන් වීමට දින දෙකකට ප්‍රථම, එනම් 2015 ජනවාරි 29 දා, ලංකාවේ පුරවැසිභාවය ලබා ගැනීම සඳහා අයැදුම් කල බවත්, පෙසප ප්‍රකාශකයෙක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසීය.

ලංකාවේ පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය අහෝසි කර ගැනීමට ගුනරත්නම් සූදානම්ව සිටින බව අදාල ආයතනයන්ට දන්වා ඇති බවත්, ගුනරත්නම්ට පුරවැසිභාවය ලබාදීම සම්බන්ධයෙන් ආගමන විගමන භාර ඇමති එස්.බී. නාවින්න විසින් නීතිපතිගේ උපදෙස් ඉල්ලා ඇති බවත්, පෙසප ප්‍රකාශකයා තවදුරටත් සඳහන් කලේය.

"යම්කිසි පුද්ගලයෙකු ලංකාවේ පුරවැසිභාවය ඉල්ලුම් කිරීම සඳහා අනෙක් රටක පුරවැසිභාවය ප්‍රතික්ෂේප කිරීමට සූදානම් වන්නේ නම් එවන් පුද්ගලයන් හට පුරවැසිභාවය ලබාදීමට ඇමති හට බලය තිබේ " යනුවෙන් ලංකාවේ පුරවැසි පනතේ සඳහන් ව තිබියදී, ගුනරත්නම්ට පුරවැසිභාවය ලබා නොදී රඳවා ගෙන සිටීම මුලුමනින්ම දේශපාලනික කරුනක් බව පැහැදිලිය.

ගුනරත්නම් අත්අඩංගුවට ගනු ලැබුවේ, අධ්‍යාපන කප්පාදුවට එරෙහිව වර්ධනය වෙමින් පැවති සරසවි සිසු උද්ඝෝෂන සම්බන්ධයෙන්, උසස් අධ්‍යාපන ඇමති ලක්ෂ්මන් කිරිඇල්ල පාර්ලිමේන්තුව තුල විශේෂ ප්‍රකාශයක් කල නොවැම්බර් 03 දාට පසු දිනයේදීය. ඔහු, සිසු උද්ඝෝෂන සම්බන්ධයෙන් "පිටස්තර බලවේග" වලට සහ විපක්ෂ දේශපාලන සංවිධාන වලට දොස් පැවරීය. මෙම විරෝධතා උද්ඝෝෂන සංවිධානය කරන ලද්දේ පෙසප මගින් මෙහෙයවන අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) විසිනි.

මෙම ප්‍රජාතන්ත්‍ර-විරෝධී පියවරයන්හි ක්ෂනික ඉලක්කය පෙසප සහ අවිශිබම වුවද, එහි ඇඟවුම් ඉන් ඔබ්බට යයි. ආන්ඩුවේ ප්‍රහාරයන්ට එරෙහිව වර්ධනය

වන කම්කරු-පීඩිත මහජනතාවන්ගේ කවර හෝ අරගලයක් මර්දනය කිරීම සඳහා මෙම 'පිටස්තර බලවේග' චෝදනාව ආන්ඩුව විසින් යොදා ගනු ඇත. මේ අර්ථයෙන් ගත් කල, ගුනරත්නම්ට එරෙහි දඩයම වනාහි, කම්කරු-පීඩිත මහජනතාවගෙ ඉදිරි අරගල සම්බන්ධයෙන් ආන්ඩුවේ මර්දනකාරී පිලිවෙත හෙලි කෙරෙන බරපතල අනතුරු ඇඟවීමකි.

ගුනරත්නම් අත් අඩංගුවට ගැනීම හෙලා දකිමින් සමාජවාදී සමානතා පක්ෂය (සසප) පසුගිය නොවැම්බර් 10 දා නිකුත් කල ප්‍රකාශයේ මෙසේ සඳහන් විය. 'ගුනරත්නම් කොන්දේසි විරහිතව වහාම නිදහස් කල යුතුයැයි කියා සිටින අතරම සසප, 2012 දී ජවිපෙන් කැඩීගිය ඔහුට හෝ ඔහුගේ ව්‍යාජ වාම පෙසප ට කිසිදු දේශපාලන සහයෝගයක් නොදක්වයි.'

කම්කරු පන්තියේ විප්ලවවාදී නායකත්වය යටතේ ගොවියන්, සිසුන් සහ අවශේෂ පීඩිතයන් බලමුලු ගන්වා ගනිමින් කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් බලයට ගෙනඒමේ සසප වැඩපිලිවෙලට පරම සතුරු, පෙසප හා අවිශිබම කැපවී සිටින්නේ ධනපති ක්‍රමයේ අර්බුදයට කර ගසා ඇති ග්‍රීසියේ සිරිසා බඳු ධනේශ්වර-ගැති මධ්‍යම පන්තික ව්‍යාපාරයක් ලංකාව තුල ගොඩනැගීමටයි.

සිරිසේන-වික්‍රමසිංහ තන්ත්‍රය ඇතුලු ලොව පුරා ධනේශ්වර පාලකයන් කම්කරු-පීඩිත මහජනතාවන්ට එල්ල කරන ප්‍රහාරයන්ගේ මූලය ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික බිඳ වැටීම යන්න පෙසප සහ අවිශිබම ප්‍රතික්ෂේප කරයි. ධනපති ආන්ඩුවට සහ ධනේශ්වර පද්ධතියට අභියෝග කරන දේශපාලනික අරගලයකට එරෙහිවන ඔවුනගේ සමස්ත දේශපාලනයම භ්‍රමනය වන්නේ බලපෑම් දැමීමේ විරෝධතා දේශපාලනය වටාය. ගුනරත්නම් නිදහස් කර ගැනීම ඇතුලු ඔහුගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා වූ අරගලය ද විරෝධතා සත්‍යග්‍රහ සහ විරෝධතා පෙලපාලි වලට පෙසප විසින් සිඳුවා ඇත්තේ එබැවිනි.

ගුනරත්නම් දිගින් දිගටම රඳවාගෙන සිටීමට එරෙහිව, ඔහු අත් අඩංගුවට ගෙන දින 77 ක් පිරුනු පසුගිය 19 දා පෙසප විසින් කොලඹ නගරයේ පැවැත් වූ පා ගමනට ආන්ඩුව ප්‍රතිචාර දැක්වූයේ පොලීසිය යොදවා කඳුලු ගෑස් එල්ල කොට පහර දී සහභාගිවූවන් පලවා හැරීමෙනි.

මෙම පොලිස් ප්‍රහාරයට එරෙහිව පෙසප විසින් 20 දා පැවැත් වූ මාධ්‍ය හමුවේදී ඔවුන් පෙල ගැසුනේ වත්මන් මර්දනකාරී ආන්ඩුව බලයට පත් කිරීම සඳහා ඍජුව හා වක්‍රව ක්‍රියා කල, එබැවින්ම ආන්ඩුවේ මෙම ප්‍රජාතන්ත්‍ර-විරෝධී ක්‍රියාවන්ට මුලුමනින්ම වගකිවයුතු ප්‍රතිගාමී සංවිධාන සහ පුද්ගලයින් සමගය. ජනාධිපති සිරිසේනගේ සම්ප්‍රාප්තිය 'ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක්' ලෙස ඔප වඩවන 'පුරවැසි බලයේ' නිර්මාල් රංජිත් දේවසිරි සහ නව සමසමාජ පක්ෂයේ නායක වික්‍රමබාහු කරුනාරත්න ඒ අතර ප්‍රමුඛ විය.

සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව බලයට ගෙන ඒමට වක්‍රව ක්‍රියා කල එක්සත් සමාජවාදී පක්ෂයේ සිරිතුංග ජයසූරිය කියා සිටියේ "මිලිටරීකරනයට ලක්ව ඇති පොලීසිය සිවිල් දෙපාර්තමේන්තුවක් ලෙසට පරිවර්තනය කරන ලෙස" ආන්ඩුවට බල කල යුතු බවයි.

ලෝක ධනේශ්වර අර්බුදය හමුවේ ලොව පුරා ආන්ඩු පොලිස්-මිලිටරි තන්ත්‍රයන් බවට පරිවර්තනය කෙරෙන තතු තුල, ශ්‍රී ලංකාවේ ආන්ඩුව තම ජාත්‍යන්තර සගයින් අනුයමින් ආරක්ෂක වියදම සියයට 17 කින් ද පොලිස් ස්ථාන සංඛ්‍යාව දෙසිය ගනනකින් ද වැඩි කර ගනිමින් පන්ති යුද්ධයට සැරසෙද්දී ජයසූරිය
ගෙනෙන මෙම යෝජනාව අතිශයින්ම ප්‍රතිගාමීය. ධනේශ්වර ක්‍රමය තුලම වඩාත් හොඳ ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපිත කල හැකිය යන මිථ්‍යාව වපුරා ධනේශ්වරයට එරෙහි දේශපාලන අරගලයකින් කම්කරු පන්තිය ඈත් කොට තැබීම එහි අරමුනයි.

ගුනරත්නම් ඇතුලු දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහි මර්දනය දිගේලි කරන අතර තම තන්ත්‍රයේ නියෝජිතයන්ගේ, පොලිසියේ සහ අනෙකුත් රාජ්‍ය නිලධාරින්ගේ මැර ක්‍රියාවලට රැකවරනය සැලසීම මේ ආන්ඩුවේ ද පිලිවෙත බව මහජනයා හමුවේ හෙලිදරව් වෙමින් පවතී.

පැහැර ගැනීමේ සිද්ධියකට වගකිව යුතු ආන්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් වන හිරුනිකා ප්‍රේමචන්ද්‍ර සති තුනක ගැටීමකින් පසු අත්අඩංගුවට ගෙන වහාම නිදහස් කලේ ය. ඇඹිලිපිටියේ සාදයකට කඩා පැන 29 හැවිරිදි එක්දරු තරුනයෙකු ඝාතනය කිරීම සම්බන්ධව පොලිසියට එරෙහි පැහැදිලි සාක්ෂි තිබිය දී පොලිසියට සුදු හුනු ගෑමේ උත්සාහයක ආන්ඩුව නිරතව සිටී. මේ ඉන් සිද්ධි කිහිපයක් පමනි.

© www.wsws.org